

# කෘෂි බෝග සඳහා හානි පමුණුවන වනජීවීන් පිළිබඳ ජාතික සංගණනය

රට තුළ ගෙවතු හා වගා භූමි ආශ්‍රිතව සැරිසරමින් ආහාර භෝග වගාවන්ට ආර්ථික හානියක් සිදුකරනු ලබන සුලභ හා පීඩාකාරී වන සතුන්ගෙන් සිදුවන බලපෑම පාලනය කිරීම මේ වනවිට විශාල අභියෝගයක් බවට පත්ව ඇත.

**මේ සඳහා විධිමත් කළමණාකරන ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම කෙරෙහි කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමුව ඇත. එහි එක් පියවරක් ලෙස 2025 මාර්තු 15 වන දින මෙම සුලභ හා පීඩාකාරී වන සතුන් පිළිබඳ දීප ව්‍යාප්ත ගහන සංගණයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.**

උක්ත සංගණනයේදී සුලබ හා පීඩාකාරී වන සතුන් කොටසක් ලෙස වාර්තා වී ඇති **වඳුරා, රිලවා, මොණරා සහ දඬුලේණා යන සතුන්ගේ ගහන ගණනය සිදුකිරීමට අපේක්ෂා කරනු ලබන අතර**

**2025. 03. 15 දින**

**පෙරවරු 8.00 සිට 8.05 දක්වා**

මිනිත්තු 05 ක කාලය තුළ තම ගෙවත්ත සහ වගා භූමි ආශ්‍රිතව සැරිසරණු ලබන ඉහත කාණ්ඩයන්ට අයත් සතුන් ප්‍රමාණය සංඛ්‍යාත්මක ව සටහන් කර ලබාදීමට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් නිවෙස් සහ වගා භූමි හිමිකරුවන් වෙත දන්වා සිටිනු ලැබේ.

සංගණනයේ දී භාවිතා කිරීමට අදාළ පත්‍රිකාව ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ කෘ.ප.නි.ස නිලධාරීන් මගින් නිවෙස් හිමියන්ට ලබා දෙනු ලැබේ.
**සම්පූර්ණ කරන ලද පත්‍රිකාව නැවත අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් මගින් වසම් භාර ග්‍රාම නිළධාරී වෙත ලබා දීමට කටයුතු කළ යුතුවේ. ග්‍රාම නිලධාරීන් විසින් අදාළ විස්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ටත් එමඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ටත් ලබාදෙනු ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අදාළ විස්තර කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබා දීමට නියමිතය. ඒ අනුව අවසන් වාර්තාව අදාළ අංශවල සහයෝගීතාවය සහිතව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සකස් කරනු ඇත.**

ජාතික වශයෙන් වැදගත් මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා අදාල වගකීම් දරණ සියළු නිළධාරීන්ගේ සහ සියළු පුරවැසියන්ගේ අවංක කැපවීම ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அமைச்சு
Ministry of Agriculture, Livestock, Lands and Irrigation